**මාධ්‍ය නිවේදනය**

**2018 මැයි 11, කොළඹදී**

# මයිලෝ අඛණ්ඩව සිව්වැනි වතාවටත් ශ්‍රී ලාංකීය සිසුන්ගේ වැඩිම මනාපයෙන් 'වසරේ ශිෂ්‍යයන්ගේ පානය' වෙයි

මයිලෝ, පාරිභෝගිකයන්ට සෞඛ්‍ය සම්පන්න තීරණ ගැනීමට දුන් දායකත්වය, සම්මානයෙන් පිදුම් ලබයි

නෙස්ලේහි ජනප්‍රිය පානයක් වන මයිලෝ, නැවත වතාවක් ශ්‍රී ලාංකීය සිසු පරපුරේ වැඩිම මනාපය හිමිකරගනිමින් 'වසරේ ශිෂ්‍යයන්ගේ පානය' සම්මානයෙන් පිදුම් ලබා තිබේ. මයිලෝ අඛණ්ඩව මෙම සම්මානය දිනාගත් සිව්වැනි වතාව ද මෙය වන අතර මයිලෝ කෙරෙහි පාරිභෝගිකයන් සතු කැමැත්ත සහ එහි ගුණාත්මක බව කෙරෙහි තබා ඇති දැඩි විශ්වාසය ඉන් මනාව පිළිබිඹු වේ.

නෙස්ලේ පාන වර්ග අංශයේ උප සභාපති නෝමන් කන්නන්ගර මහතා මේ පිළිබඳ අදහස් දක්වමින් මෙසේ පැවසීය. "වසර 30ක කාලයක් පුරා මයිලෝ, බිම් මට්ටමේ පටන් පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් සහාය දීමට ඉදිරියෙන් කැපවී සිටිනවා. ඒ හරහා පාසල් සිසුන් දහස් ගණනකට ශාරීරිකව ක්‍රියාශීලී වීමට මෙන්ම දක්ෂ ක්‍රීඩකයින් රැසකට ඔවුන්ගේ අනාගතය සඳහා අවශ්‍ය සහයෝගය ද ලබා දී තිබෙනවා. ඊට අමතරව ළමුන්ව සෞඛ්‍යමත් ජීවන රටාවක් වෙත යොමුකිරීමට අවශ්‍ය නව පියවර රාශියක් අපි ක්‍රියාත්මක කර තිබෙනවා. සෞඛ්‍ය සම්පන්න උදෑසන ආහාරවේලක් සම්බන්ධ වැඩසටහනත්, අසුරනයේ පෝෂ්‍ය කොටස් අන්තර්ගතය පිළිබඳ සඳහන් කිරීමත් ඊට උදාහරණ ලෙස දැක්විය හැකියි. මෙනිසා දශක ගණනාවක් පුරා ශ්‍රී ලාංකීය ළමුන්ට 'fuelling the winning spirit' යන අපේ තේමාව යටතේ සහාය වීමත්, උසස් ප්‍රමිතියෙන් යුත් මෙම නිෂ්පාදනයට ඇති පිළිගැනීමත් පිළිබිඹු කරමින් සිව්වැනි වතාවටත් මේ සම්මානය මයිලෝ වෙත හිමිවීම ගැන අපි මහත් සේ සතුටට පත්වෙනවා".

'වසරේ ශිෂ්‍යයින්ගේ පානය' යන සම්මානය පිරිනමනු ලබන්නේ ඩී.එස්. සේනානායක විදුහල් වාණිජ සංගමය විසිනි. දේශීය තරුණ පරපුර වෙනුවෙන් සුබවාදී දායකත්වයක් සැපයූ ව්‍යාපාර ඇගැයීමත්, ශිෂ්‍යයන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබාදීමත් මෙහි අරමුණ වේ. මෙම සම්මානය ප්‍රදානය කරනු ලබන්නේ බස්නාහිර පළාතේ පාසල් සිසුන් 9,000ක් පමණ ආවරණය වන පුළුල් සමීක්ෂණයක ප්‍රතිඵල අනුව ය. එහිදී පාසල් සිසුන් විසින් තම ප්‍රියතම නිෂ්පාදනය වෙනුවෙන් මනාපය පළ කරන අතර මෙම සම්මාන උළෙලේ ආරම්භයේ පටන් අඛණ්ඩව 'වසරේ ශිෂ්‍යයන්ගේ පානය' හිමි සම්මානය දිනාගැනීමට මයිලෝ සමත්වී ඇත.

මයිලෝ යනු විටමින් සහ ඛනිජ ලවණ වලින් පරිපූර්ණ වූ නෙස්ලේ සමාගමේ ලොව ප්‍රමුඛතම චොක්ලට් මෝල්ට් පානය යි. දහස් ගණනක් ශ්‍රී ලාංකික කිරි ගොවීන්ගෙන් ලබාගන්නා කිරි යොදාගනිමින් සාදන මයිලෝ, දරුවන් අතර කිරි පානය දිරිමත් කරයි.

කුරුණෑගල පිහිටි අති නවීන නිෂ්පාදනාගාරය තුළ මයිලෝ නිපදවන්නේ, ගෝලීය වශයෙන් ඇගැයීමට පත් නෙස්ලේ සමාගමේ උසස් ප්‍රමිතීන්ට අනුකූලව ය.

මයිලෝ සන්නාමයේ නවතම පියවර වනුයේ, එහි RTD (Ready-To-Drink) පානයෙහි නව ඇසුරුමය. මයිලෝ මගින් අනුග්‍රාහකත්වය දරනු ලබන ක්‍රීඩා හයක් නිරූපිත එම පැකට්ටු මගින් ද ළමුන්ගේ ශාරීරික ක්‍රියාකාරකම් දිරිමත් කරයි. එම ඇසුරුම්වල අන්තර්ගත පෝෂණ කොටස් දැක්වෙන වැඩිදියුණු කරන ලද ලේබලයක් ද තිබේ. සෑම මයිලෝ RTD පානයකම අඩංගු වන්නේ තේ හැඳි දෙකකට වඩා අඩු සුක්රෝස් (එකතු කළ සීනි) ප්‍රමාණයකි. එනම් එක් නිෂ්පාදනයක් තුළ ඇති එකතු කළ සීනි ප්‍රතිශතය සියයට 05කටත් අඩු ය. මයිලෝ RTD යනු මෙරට කිරි පාන වර්ග අතරින් වෙළෙඳපොළේ අඩුම සුක්රෝස් ප්‍රමාණයක් සහිත පානයකි.

දශක තුනකටත් අධික කාලයක් තිස්සේ මයිලෝ, මෙරට පාසල් ක්‍රීඩාවල දියුණුව වෙනුවෙන් දායකත්වය ලබා දී ඇත. පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ප්‍රධාන අනුග්‍රාහකයෙකු වන මයිලෝ, රග්බි, පිහිනුම්, දැල්පන්දු, මලල ක්‍රීඩා සහ හොකී වැනි ක්‍රීඩාවන්ට තම සහයෝගය පිරි නමා තිබේ. පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ශ්‍රේෂ්ඨතම අවසානය වනුයේ මයිලෝ විසින් අනුග්‍රාහකත්වය සපයනු ලබන ශ්‍රී ලංකා පාසල් වර්ණ ප්‍රදානෝත්සවයයි. එහිදී දක්ෂතම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කාර්ය සාධනය ඇගැයීමට ලක්කිරීම සඳහා ඔවුන්ට ගෞරවය දක්වයි. ජාතික පාසල් ක්‍රීඩා වෙනුවෙන් දැක්වූ දායකත්වය තුළින් දක්ෂ ක්‍රීඩකයින් නංවාලීමට මයිලෝ සහාය ලබා දී ඇති අතර, බොහෝදෙනෙක් රට නියෝජනය කිරීමට ගොස් ඇත. ජාතික ක්‍රිකට් කණ්ඩායමේ නායක මෙන්ම මයිලෝ වෙළෙඳ නාම තානාපතිවරයා වන ඇන්ජෙලෝ මැතිව්ස් ද අඛණ්ඩව වසර දෙකක් ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා වර්ණ ප්‍රදානෝත්සවයේ වර්ණ ලාභියෙකි.

තව ද පරිපූර්ණ සහ සමබල පෝෂණයක් ලබාදීම වෙනුවෙන් පෙනී සිටින තම සන්නාම පොරොන්දුව අනුව යමින් වාර්ෂිකව 'Mom, Me and My *Milo*' වැඩසටහන ද මයිලෝ සංවිධානය කරයි. එහිදී පාසල් ළමුන් 1,000කට පාපැදි ලබාදෙමින් දැවැන්ත පාපැදි රැළියක් සංවිධානය කරමින් ශාරීරිකව ක්‍රියාකාරී වීම තුළ විනෝදය ද ලබාගත හැකි බව පෙන්වා දේ. මෙම වැඩසටහන, මෙරට විශාලතම උදෑසන ආහාර පිරිනැමීමේ සත්කාරකත්වය ද සපයයි. වැඩසටහනට එක්වන දරුවන්ට හා ඔවුන්ගේ මව්වරුන්ට පිරිනමන මෙම උදෑසන ආහාරවේල හරහා ඔවුන්ට සෑම උදෑසනකදීම සෞඛ්‍ය සම්පන්න ආහාරවේලක් ලබාගැනීමට පොරොන්දු වීමට ඔවුන්ව දිරිමත් කරයි. මෙය වසර පුරාවට මුද්‍රිත මාධ්‍ය හා සමාජ මාධ්‍ය ඔස්සේ සෞඛ්‍ය සම්පන්න ආහාර ලබාගැනීමේ වැදගත්කම අවධාරණය කරන මයිලෝ ප්‍රවර්ධන වැඩසටහනේ එක් අංගයකි.